# ආදි බෞද්ධ හා යෝගාචාර විඥානවාදී ඉගැන්වීම් තුළ දැක්වෙන "ප්‍රත්‍යක්ෂය" පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

**කරපික්කඩ සෝභිත හිමි**

ආදි බුදුසමයට අනුව ''විඤ්ඤාණ'' යන පදය බොහෝ සෙයින් යෙදී ඇත්තේ ''විජානනය'' හෙවත් දැනුම, දැනගැනීම යන අර්ථයන් දැක්වීම සඳහාය.[1] ඒ තුළ අර්ථවත් වනුයේ බාහිර විෂය වස්තු පිළිබඳ ප්‍රත්‍යක්ෂය ඇතිකරලීම යි. මෙහි දී පුද්ගලයා ප්‍රත්‍යක්ෂය ලබාගන්නා වූ ප්‍රමුඛ මාධ්‍යය 02ක් පිළිබඳ ආදි බෞද්ධ සූත්‍ර දේශනා තුළ සඳහන් වේ. එනම්,

1. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය
2. අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය

යෝගාචාර විඥානවාදී සංකල්ප හා ගැළපීමේ දී මෙම ප්‍රත්‍යක්ෂ ක්‍රමවේදයන් දෙකම ඉතා වැදගත් වේ. මෙහි "ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය" ලෙස දක්වා ඇත්තේ චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන යන ඉන්ද්‍රියයන් මඟින් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධම්ම යන බාහිර අරමුණු පිළිබඳ ප්‍රත්‍යක්ෂය හෙවත් දැනීම ඇතිකර ගැනීමයි. මෙහිලා උක්ත ප්‍රත්‍යක්ෂය ලබා ගැනීමේ දී සිදුවන්නා වූ ක්‍රියාදාමය පිළිබඳ ම.නි. මධුපිණ්ඩික සූත්‍රයෙහි පුළුල් වූ විග්‍රහයක් දැකගත හැකිය.[2]

ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලියේ දී මූලිකව සිදුවන්නා වූ කාරණාව නම් ඉන්ද්‍රියයත් අරමුණත් එකට ගැටීමයි. ''චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංඝති ඵස්සො'' එම ගැටීම ''විඤ්ඤාණය'' පදනම්ව සිදු වේ. මෙසේ ඉන්ද්‍රියයත්, අරමුණත් විඤ්ඤාණය පදනම්ව ගැටීම ''ඵස්ස'' හෙවත් ස්පර්ශය ලෙස දක්වා ඇත. මෙහි ඉන්ද්‍රියය ලෙස දක්වා ඇත්තේ ඉහත දැක්වූ චක්ඛු, සෝත ආදී වූ ඉන්ද්‍රියයන් ය. අරමුණු ලෙස දක්වා ඇත්තේ ඉහත දැක්වූ රූප, ශබ්ද ආදි වූ අරමුණු ය. ''විඤ්ඤාණය'' යනු මානසික සාධකය යි. ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලියේ දී වන්නා වූ මෙම මූලික ක්‍රියාදාමය පිළිබඳ තවදුරටත් විමසීමේ දී ම.නි. මහාතණ්හාසංඛය සූත්‍රය, උක්ත කාරණාව පිළිබඳ වෙනත් අයුරකින් විග්‍රහ කොට ඇති අයුරු දැකගත හැකිය. එහි

දී උක්ත කාරණාව පිළිබඳ සඳහන් වනුයේ ප්‍රත්‍යක්ෂ සඳහා වන්නා වූ මූලික කාරණාවන් ලෙසය. ඒවා නම්,

1. ඉන්‍ද්‍රියයන්ගේ නොපිරිහුණු බව,
2. බාහිර අරමුණ පැමිණීම,
3. ''තජ්ජසමන්නාහාරය'' හෙවත් මානසික උපයෝගීතාවය[3]

මෙහි ඉන්ද්‍රියයන්ගේ නොපිරිහුණු භාවය ලෙස දක්වා ඇත්තේ චක්ඛු, සෝත ආදී වූ ඉන්ද්‍රියයන් විකලත්වයෙන් තොර වීමයි. බාහිර අරමුණ පැමිණීම යනු රූප, ශබ්ද ආදී අරමුණු පැවතීමයි. ''තජ්ජසමන්නාහාරය'' යනු ඉන්‍ද්‍රිය හා අරමුණ මානසිකව ගැටීමට ලක් වීමයි. මෙසේ මෙම මූලික කරුණු සම්පූර්ණ වීමෙන් චක්ඛු විඤ්ඤාණ ආදී වූ විඤ්ඤාණයාගේ පහළ වීම සිදු වේ. ''එවං තජ්ජස්ස චක්ඛු විඤ්ඤාණස්ස පාතුභාවො හොති'' නමුත් මෙසේ පහළ වන්නා වූ චක්ඛු විඤ්ඤාණය ආදි විඤ්ඤාණයෝ ආදි බුදුසමයට අනුව නිර්විකල්පිත වූ අවස්ථාවක් ලෙස දක්වා ඇත. නිර්විකල්පිත අවස්ථාවක් යනු ක්ලේෂ ග්‍රහණයෙන් තොර වූ තත්‍වයකි. මෙම අවස්ථාව ''ආනුභූතික විඤ්ඤාණ අවස්ථාව'' ලෙස ද දක්වා ඇත. එනම් ඉන්ද්‍රියට අරමුණක් තිබේය යන හැඟීම පමණක් නිර්මාණය වන්නා වූ අවස්ථාවකි. එය පූර්ණ වූ ප්‍රත්‍යක්ෂ අවස්ථාවක් නොවේ. පසුකාලීනව නිර්විකල්පික විඤ්ඤාණ අවස්ථාව ලෙස ද, ප්‍රජානන විඤ්ඤාණ අවස්ථාව ලෙස ද, සංජානන විඤ්ඤාණ අවස්ථාව ලෙස ද විග්‍රහ වන්නේ මෙම අවස්ථාවයි.

පසුකාලීන අටුවා විවරණයන් තුළ මේ පිළිබඳ දැක්වෙන්නේ ''දර්ශන මාත්‍ර වූ, (දස්සන මත්තං) ආපාත මාත්‍ර වූ (ආපාත මත්තං) අවස්ථාවක් ලෙසය. බුද්ධඝෝෂ හිමියෝ මෙම අවස්ථාව දක්වනුයේ ''රූප දර්ශන මාත්‍රයක් චක්ඛු විඤ්ඤාණයෙන් දැක ඇත'' යනුවෙනි. ආභිධම්මිකයෝ ද මේ පිළිබඳ දක්වා ඇත්තේ හුදු දැනීම් මාත්‍රයක් පමණක් බවය. ''රූපදස්සන මත්තෙන චක්ඛු විඤ්ඤාණෙන රූපං දිස්වා''[4] එසේම ම.නි. අටුවාව තුළ මේ පිළිබඳ දැක්වෙනුයේ හුදු දර්ශන, ශ්‍රවණ, ඝාණන, චින්තන, පූසන අවස්ථාවක් ලෙසට ය.[5]

මෙසේ ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලියේ වන්නා වූ මූලික අවස්ථාව සංක්ෂිප්තයක් ලෙස දැක්වීමේ දී ඉන්‍ද්‍රිය විඤ්ඤාණ අවස්ථාව යම්

අරමුණක් සාකල්‍යයෙන් වටහා ගැනීමට ප්‍රථම ඇතිවන දැනීම යන අදහස දැක්විය හැකිය.

මෙහි දී විමසිය යුතු තවත් වැදගත් කරුණක් වේ. එනම් ම.නි. මහාහත්ථිපදෝපම සූත්‍රයෙහි දැක්වෙන, උක්ත ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලියෙහි මූලික අවස්ථාවන්ගෙන් අනතුරුව සිදුවන්නා වූ ''විඤ්ඤාණභාගස්ස පාතුභාවො හොති'' යන ''විඤ්ඤාණ භාගයාගේ පහළ වීම'' යනු කුමක්ද යන්නයි. සූත්‍රයෙහි මේ පිළිබඳ දැක්වෙන විවරණය වන්නේ ''ඉදින් ආධ්‍යාත්මික වූ මනස නොබිඳුනේ ද, බාහිර ධර්මයෝ ආපාතයට පැමිණෙන්නේ ද, එහෙත් අනුරූපි වූ මෙනෙහි කිරීමක් නොමැති නම් ඒතාක් ඊට අනුරූපී වූ විඤ්ඤාණ භාගය පහළ වීමක් නොවේ.''[6] මේ අනුව ''විඤ්ඤාණ භාගස්ස පාතුභාවො හොති'' යන්න සඳහා යෙදී ඇත්තේ ''විඤ්ඤාණ කොටස් පහළ වීම'' යන්නයි. ඒ තුළ ද අර්ථවත් වනුයේ පරිපූර්ණ වූ වෛඥානිකත්වයක් නිර්මාණය වී නොමැති බවයි.

යෝගාචාර විඥානවාදය තුළ ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලිය අවධාරණය වනු ලබන්නේ ත්‍රිවිධ පරිණාමයක් ඔස්සේ ය. එනම් ආලය විඥානය, මනන විඥානය, ප්‍රවෘත්ති විඥානය යන විඥානයන්ගේ එකතුවෙනි. මෙහි දී යෝගාචාර ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලිය ආදී බෞද්ධ ඉගැන්වීම් හා සැසඳීමේ දී විග්‍රහයේ පහසුව සඳහා උක්ත ත්‍රිවිධ පරිණාමය අවරෝහණ පටිපාටිය තුළ විමසීම ඉතා වැදගත් වේ. ඒ අනුව ඔවුන් දක්වන තුන්වන පරිණාමය ප්‍රවෘත්ති විඥානය යි. එනම් රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම යන අවස්ථාවන්ගේ යම් ලැබීමක්, පැමිණීමක් වේද එය යි.[7] මේ සඳහා යෝගාචාරීහු ප්‍රවෘත්ති විඥානයට අදාළව සයවැදෑරුම් විඥානයක් දක්වයි.

01. චක්ෂුර් විඥානය

02. ශ්‍රෝත විඥානය

03. ඝ්‍රාන විඥානය

04. ජිව්හා විඥානය

05. කාය විඥානය

06. මනො විඥානය

මෙහි සංඛ්‍යාත්මකව හා ඉන්ද්‍රිය අරමුණු වශයෙන් ගත් කල, ආදි බුදුසමයෙහි දැක්වෙන ඉන්ද්‍රියයන්ට හා අරමුණුවලට සමාන බව පෙනේ. නමුත් ''තජ්ජසමන්නාහාරය'' මත අරමුණු පිළිබඳ ප්‍රත්‍යක්‍ෂයක් ලැබිය හැකි බව යෝගාචාරීන් පිළිගන්නේ නැත. එයට හේතුව ලෙස ඔවුන් දක්වනුයේ මානසික වූ ක්‍රියාදාමයක් තුළින් වස්තුව පිළිබඳ යම් දැනීමක් ලැබීමේ දී එම දැනීම් අවස්ථාව වනවිට වස්තුව අභාවයට ගොස් ඇති බැවිනි. එබැවින් යෝගාචාරීහු ආදි බුදුසමයේ දැක්වෙන ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය හෝ අතීන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය අවධාරණය කරන්නේ නැත. සියල්ල පිළිබඳ ඔවුන් දක්වනුයේ විඥප්තිමාත්‍රයකි. එනම් බාහිර විෂය වස්තුව පිළිබඳ ලැබිය හැක්කේ චිත්ත නිර්මිතයක් පමණක් බවයි. විඥප්තිමාත්‍රතාසිද්ධිවාදයෙහි ''විඥප්තිමාත්‍රතාව''ලෙස විග්‍රහ කරනුයේ ද උක්ත අදහසයි.

මෙසේ නිර්මාණය වන්නා වූ චිත්ත නිර්මිතයේ ස්වභාවය උක්ත ත්‍රිවිධ පරිණාමය ඔස්සේ සිදු වේ. මෙහි දී ප්‍රවෘත්ති විඥානයාගේ කාර්ය වන්නේ ඉන්ද්‍රියයන් මඟින් අරමුණු ලබාගැනීමයි. එම අරමුණු ලබාගැනීමේ දී සබ්බචිත්තසාධාරණ චෛතසිකයන් ද, නියති චෛතසිකයන් ද, කුශල චෛතසිකයන් ද, උපක්ලේශයන් ද, ත්‍රිවේදනාවන් ද මෙම ප්‍රවෘත්ති විඥානය සමග ක්‍රියාත්මක වන බව විඥප්තිමාත්‍රතාවෙහි දැක්වේ.[8]

එසේම ආර්ය ලංකාවතාර සූත්‍රය දක්වන ආකරයට මෙම ප්‍රවෘත්ති විඥානය තුළින් කාරණා චතුෂ්කයක් ප්‍රභවය වේ.

1. තමාගේම සිත දකින බව නොදැන බාහිර ලොව ග්‍රහණය කිරීම.
2. අනාදිකාලිකව සිදුකළ ප්‍රපංචකරණය සහ සාවද්‍ය දෘෂ්ටි මඟින් රැස් කරගන්නා ලද්දා වූ රූපයට හා වාසනා ශක්තීන්ට ඇලීම.
3. විඥානය තුළ පවත්නා නෛසර්ගික ස්වභාවය
4. විචිත්‍ර රූප ලක්‍ෂණ පිළිබඳ ඇති කුතුහලය

මෙසේ ප්‍රවෘත්ති විඥානය නිර්මාණය වුව ද එය සංජානන ක්‍රියාවලියට යොමුවන්නේ මනෝ විඥානයේ බලපෑමත් සමඟ ය.

එබැවින් ප්‍රවෘත්ති විඥානය හුදු තනි සාධකයක් ලෙස ගතහොත් මුල් බුදුසමයේ දක්වන්නා වූ නිර්විකල්පිත තත්‍ත්වයට සමාන වූ අවස්ථාවක් ලෙස දැක්විය හැකිය. නමුත් යෝගාචාරීන්ගේ ත්‍රිවිධ පරිණාමය එකිනෙකට බද්ධ වූවකි. එක් වෛඥානික ධර්මයක් අනෙකෙන් බාහිරව කිසිසේත් නොපවතියි. එබැවින් ප්‍රවෘත්ති විඥානය මුල් බුදුසමයේ විඤ්ඤාණයන් හා සැසඳිය නොහැකි බව පෙනේ.

ආදි බුදුසමයේ විග්‍රහ වන්නා වූ ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලිය තුළ නිර්විකල්පිත වූ වෛඥානික අවස්ථාව ත්‍රිවිධ වේදනාව දක්වා පවතියි. එනම් සුඛ, දුක්ඛ, අදුක්ඛමසුඛ යන වේදනාවෝ ය. එම වේදනාවන් උක්ත ඉන්ද්‍රිය, අරමුණ, තජ්ජසමන්තාහාරය යන ධර්මත්‍රයේ ස්පර්ශයෙන් නිර්මාණය වන අතර, ඒ තුළ ක්ලේශ ග්‍රහණයක් අර්ථවත් වී නොමැත. එබැවින් එය නිර්විකල්පිත වූ තත්‍ත්වයක් ලෙස දැක්වේ. මෙම නිර්විකල්පිත අවස්ථාව සවිකල්පිත විඥාන අවස්ථාවක් දක්වා වර්ධනය වනුයේ සංජානනයත් සමඟ ය. ''යං වෙදෙති තං සංජානාති'' එනම් එම වේදනාවන් පිළිබඳ හැඳින ගැනීමයි. ඇසෙන් රූපයක් දැක, එම රූපය පිළිබඳ හැඳින ගැනීම සංජානනය තුළ අර්ථවත් වී නොමැත. ඒ තුළින් සිදුවන්නේ රූපය දැකීමෙන් ඇති වූ සුඛ, දුක්ඛ, අදුක්ඛමසුඛ යන වේදනාවන් පිළිබඳ හැඳින ගැනීමයි. මෙම සංජානනයෙන් අනතුරුව එම වේදනාවෝ විතර්කනයට ලක් වේ. එනම් ඡන්ද, දෝස, මෝහ යන මනෝ ධර්මයන්ගෙන් යුක්ත, කාම, ව්‍යාපාද, විහිංසා යන විතර්කයන්ගෙන් ලැබූ වේදනාව තවදුරටත් වර්ධිත තත්වයට පත් කිරීමයි. මෙය තමා විසින්ම සිතා මතා කරනු ලබන්නකි. මෙහි දී අකුසල විතර්කය නිරන්තරයෙන්ම ඡන්ද, දෝස, මෝහ යන මනෝ ධර්මයන්ගෙන් යුක්තව පවත්නා බව පෙල දහමේ දක්වා ඇත.[9]

එබැවින් හඳුනාගත් වේදනාවන් තවදුරටත් විතර්කය කිරීමේ දී ඡන්දය නිසා කාම විතර්කය ද, දෝසය නිසා ව්‍යාපාද විතර්කය ද, මෝහය නිසා විහිංසා විතර්කය ද ගොඩනැගේ. මෙම විතර්කනයෙන් අනතුරුව ලැබූ වේදනාව පිළිබඳ ප්‍රපඤ්චකරණය සිදුවේ. **''යං විතක්කෙති තං පපඤ්චෙති''** එනම්, එම වේදනාව පිළිබඳ දැඩි සේ පැතිරීමක්, ව්‍යාප්තියක්, ග්‍රහණය කරගැනීමක් සිදුවීමයි. ම.නි. අට්ඨකතාව මේ පිළිබඳව දක්වා ඇත්තේ ''ප්‍රපඤ්ච යනු තෘෂ්ණා, දෘෂ්ටි, මාන වශයෙන් ග්‍රහණය කරගැනීම'' යනුවෙනි.[10]

ලැබූ අරමුණ කෙරෙන් තෘෂ්ණා සහිතව සතුටු වීම, අභිවාදනය කිරීම හෙවත් මමය, මාගේය සංකල්පයෙන් යුක්ත වීම, අද්‍යාවසාය වශයෙන් ගැනීම හෙවත් දෘෂ්ටිමය වශයෙන් පිළිගැනීම මෙහි දී සිදු වේ. මීට අමතරව අතීත, වර්තමාන, අනාගත ධර්මයන් පිළිබඳ පුද්ගලයා ඇලී, ගැලී බැඳී සිටීම ප්‍රපඤ්චකරණයෙහි ලක්‍ෂණයයි. ඇලී ගැලී සිටීම යනු, යමක් ගැනීමට නම් ''මම'' යන සංකල්පය ගොඩනැගී තිබිය යුතු වේ. ''මම'' යන්න ගොඩනැගෙන්නේ ''මාගේ'' යන අයිතිවාසිකම් හා සම්බන්ධ සංකල්පනයෙන් අනතුරුවයි. මෙයට අනුව මමය, මාගේය යන ආත්මවාදී සංකල්පය තුළ මෙම ප්‍රපඤ්චකරණය ගොඩනැගේ. මේ පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කිරීමේ දී බාහිර විෂය පිළිබඳ පූර්ණ වූ සවිකල්පිත තත්‍වය මෙම ප්‍රපඤ්චකරණය තුළින් දැක්වේ. ඉතා සරලව මේ පිළිබඳ දැක්වීමේ දී බාහිර විෂය වස්තු පිළිබඳ චිත්ත නිර්මිතයක් මේ තුළ සිදු වී ඇත.

යෝගාචාර සම්ප්‍රදාය තුළ දැක්වෙන ත්‍රිවිධ පරිණාමයෙහි ඇතුළත් මනන විඥානය සහ ආලය විඥානය තුළ, උක්ත ආදි බෞද්ධ ඉගැන්වීම්හි අන්තර්ගත ප්‍රපඤ්චකරණය සඳහා පදනම් වූ ක්ලේෂ බීජයන් සේම, විඥප්තිමාත්‍රතාවය දැක්වීම සඳහා වූ ක්ලේශ බීජයන් ඇතුළත්ව ඇතිබව පෙනීයයි. මෙහි දී විඥප්තිමාත්‍රතාසිද්ධිවාදයට අනුව මනන විඥානය හෙවත් ප්‍රවෘත්ති විඥානයත්, ආලය විඥානයත් අතර වූ විඥානය තුළ ප්‍රධාන වශයෙන් ආත්ම දෘෂ්ටි, ආත්ම මාන, ආත්ම ස්නේහ, ආත්ම සංඥා, යන චතුර්විධ ක්ලේශයන් නිරන්තරයෙන් ඇතුළත් වී ඇත.[11] ප්‍රවෘත්ති විඥානය තුළින් ලබන්නා වූ බාහිර විෂය වස්තු පිළිබඳ දැනීම ආත්මීය වශයෙන් පුද්ගලයා ග්‍රහණය කරගනු ලබන්නේ මෙම මනන විඥානය තුළ ඇති ඉහත දැක්වූ ක්ලේශ ධර්මයන් පදනම් කොටගෙනය. එබැවින් මෙම විඥානය ක්ලිෂ්ඨ මනෝ විඥානය ලෙස ද දක්වා ඇත. එසේම ආලය විඥානය ඇතුලු සියලු සිත්තුල යෙදෙන්නා වූ සබ්බචිත්ත සාධාරණ චෛතසික වන ස්පර්ශ, මනසිකාර, වේදනා, සංඥා, චේතනා යන පඤ්චවිධ චෛතසිකයන් ද මෙම මනන විඥානය තුළ ඇතුළත් වී ඇත.[12] ආර්ය ලංකාවතාර සූත්‍රයට අනුව ෂඩ් විඥානයන් මඟින් ගෙන එනු ලබන ආරම්මණයන්ගේ ස්වභාවය විමසා බැලීම, නිර්ණය කිරීම, මෙනෙහි කිරීම මෙම මනන විඥානයෙන් සිදු කරනු ලබන අනෙකුත්

කාර්යය යි. ආදි බුදුසමයේ දැක්වෙන සංජානනය, විතක්කය, ප්‍රපඤ්චකරණය යන අවස්ථාවන් මෙම මනන විඥානයේ ක්‍රියාකාරීත්වය තුළ අර්ථවත් වී ඇති ආකාරය දැකගත හැකිය.

මීට අමතරව ආදි බුදුසමය තුළ විග්‍රහ වන්නා වූ ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලියෙහි දක්නට නොලැබෙන අවස්ථාවක් යෝගාචාරීන්ගේ ආලය විඥාන සංකල්පය තුළින් දක්වා ඇත. මෙහි දී බාහිර අරමුණු විෂය තුළ, ඒ සඳහා පුද්ගලයා සාංසාරිකව තැන්පත් කරගනු ලබන ක්ලේශ බීජයන් පදනම් වන ආකාරය පෙන්වා දී ඇත. ආලය විඥානය යනු, සියලු ක්ලේශ බීජයෝ තැන්පත් වන්නා වූ ස්ථානය යි. එහි ක්ලේශ බීජයන්ට අමතරව සියලු කර්ම බීජයන් මෙන්ම ස්මෘති බීජයන් ද තැන්පත් වී ඇත.[13] බාහිර විෂය වස්තු ග්‍රහණයේ දී මනන විඥානය ක්‍රියාත්මක වීම තුළ ආලය විඥානයේ ඇති කර්ම, බීජ, ක්ලේෂ බීජ, ස්මෘති බීජ ආදිය ක්‍රියාකාරී වේ. ඒ අනුව එම ක්ලේශ බීජයන් පදනම්ව ප්‍රවෘත්ති විඥානයක් පහළ වීම සිද්ධ වේ. එසේම පහළ වන්නා වූ එම විඥානයන් තුළින් නිර්මාණය වන්නා වූ ක්ලේශ බීජයෝ නැවතත් ආලය විඥානයෙහි තැන්පත් වේ. මෙසේ ආලය විඥානයාගේ ක්‍රියාකාරීත්වය අර්හත්වය දක්වා සිදුවෙන බව විඥප්තිමාත්‍රතාසිද්ධියෙහි විග්‍රහ වී ඇත.[14]

මෙසේ ත්‍රිවිධ පරිණාමයක් ඔස්සේ ක්‍රියාත්මක වන්නා වූ මෙම විඥාන ක්‍රියාවලියෙහි අවසානය, ලෝක වස්තූන් පිළිබඳ විකල්පිත වූ ස්වරූපයක් චිත්තසන්තානය තුළ නිර්මාණය වීමයි. එය පරිකල්පිතයකි. හෙවත් මවාගැනීමකි. එය විඥානයම පදනම් වූවකි. යෝගාචාර සම්ප්‍රදායේ ප්‍රමුඛ ඉගැන්වීම ලෙස දැක්වෙන ''විඥප්තිමාත්‍රතාව'' ලෙස දැක්වෙන්නේ මෙම ආකල්පයයි. විඥප්තිමාත්‍රතාසිද්ධිවාදය තුළ ''යම් ආකාරයෙන් තිමිර රෝගයෙන් පෙළෙන මිනිසාට සත්‍ය නොවූ කෙස් ගුලියක්, චන්ද්‍ර මණ්ඩලයක් දර්ශනය වේද ඒ ආකාරයෙන් සියලු විෂයයන් අසත්‍ය වීම නිසා සියල්ල විඥප්තිමාත්‍රයක්'' ලෙස දක්වා ඇත.[15]

මෙහි සියල්ල "අසත්" ලෙස දක්වා ඇත්තේ බාහිර විෂය වස්තු සියල්ල පුද්ගලයා ස්වචිත්ත සන්තානය තුළ ආලය, මනන, ප්‍රවෘත්ති යන ත්‍රිවිධ විඥාන පරිණාමය පදනම් කොටගෙන ක්ලේශ බීජ පදනම්ව නිර්මාණය කරගනු ලබන බැවිනි. එසේම ප්‍රවෘත්ති විඥානයත්, ආලය විඥානයත් ක්‍රියාත්මක වන්නා වූ කාල පරාසය තුළ වස්තු අභාවය සිද්ධ වී ඇති බැවිනි. යෝගාචාරීහු මේ තුළින් පෙන්වා දීමට උත්සාහ කරනුයේ පුද්ගල නෛරාත්මයේ මෙන්ම ධර්ම නෛරාත්මයේ ද අස්තිත්වය යි.[16]

මෙම ඉගැන්වීම ආදි බුදුසමයේ ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලිය හා ගැළපීමේ දී ප්‍රවෘත්ති විඥාන, මනන විඥාන, ආලය විඥාන යන අවස්ථාවන් තුළින් ආදි බුදුසමයෙහි වූ දේශනාව පිළිබඳ යම් ප්‍රවණතාවයක් සිදු වී ඇති නමුදු, එහි අවසානයෙහි දැක්වෙන්නා වූ විඥප්තිමාත්‍රතාව හා ප්‍රපඤ්චකරණය සංකල්පමය වශයෙන් බොහෝ දුරට සමානත්වයක් උසුලයි. ප්‍රපඤ්චකරණය යනු ක්ලේෂ බීජයෝ පදනම් කොට ගනිමින් බාහිර විෂය වස්තූන් පිළිබඳ සාවද්‍ය වූ ආකල්පයක් චිත්ත සන්තානය තුළ නිර්මාණය වීමයි. එසේම විඥප්තිමත්‍රතාවය යනු ද ත්‍රිවිධ පරිණාමය තුළින් බාහිර විධය වස්තු පිළිබඳ නිර්මාණය වන්නා වූ පරිකල්පිත අවස්ථාවකි. එබැවින් ප්‍රපඤ්චකරණය දාර්ශනික ලෙස සංවර්ධනය කොට දැක්වීමක් ලෙස විඥප්තිමාත්‍රතාවය නිර්මාණය වූ බව සිතිය හැක.

## ආන්තික සටහන්

1. විජානාතී ති බො භික්ඛවෙ තස්මා විඤ්ඤාණන්ති වුච්චති. <u>ම.නි.</u> මහාවේදල්ල සූත්‍රය, 2003, බු.ජ.මු. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, පි. 686.
2. චක්ඛුඤ්චාවුසො පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංගති ඵස්සො. ඵස්ස පච්චයා වෙදනා යං වෙදෙති තං සංජානාති. යං සංජානාති තං විතක්කෙති. යං විතක්කෙති තං පපඤ්චෙති. තතො නිදානං පුරිසං පපඤ්ච සඤ්ඤා සංඛා සමුදාචරන්ති. අතීතානගත පච්චුප්පන්නෙසු චක්ඛු විඤ්ඤෙය්‍යෙසු රූපෙසු <u>ම.නි</u>. I, මධුපිණ්ඩික සුත්ත, බු.ජ.මු., පි. 280.
3. අජ්ඣත්තිකො තෙ ආවුසො මනො අපරිභින්නං හොති. බාහිරා ච ධම්මා ආපාතං ආගච්ඡන්ති. නො ච තජ්ජොව සමන්නාහාරො හොති. නෙවතාව තජ්ජස්ස විඤ්ඤාණභාගස්ස පාතුභාවො හොති. <u>ම.නි</u>., මූලපණ්ණාසපාළි, ඔපම්ම වග්ග, මහාහත්ථිපදොපම සුත්ත
4. අනුදීපනීපාඨ, චිත්තසඞ්ගහඅනුදීපනා

5. චක්ඛු විඤ්ඤෙය්‍යාදි චක්ඛු විඤ්ඤාණෙන පස්සිතබ්බො ම.නි. අටුවාව. II පි. 568.
චක්ඛු විඤ්ඤාණ විඤ්ඤාතබ්බ ධම්මෙසු ම.නි. අටුවාව V. පි. 93.
චක්ඛු විඤ්ඤාණන්ති රූප දස්සන මත්තං එව ම.නි. අටුවාව. II පි. 349.
චක්ඛුම්හි විඤ්ඤාණං චක්ඛුනොවා ජාතං විඤ්ඤාණන්ති චක්ඛු විඤ්ඤාණං සං.නි. අටුවාව II පි. 17.
6. අජ්ඣත්තිකො තෙ ආවුසො මනො අපරිභින්නං හොති. බාහිරා ච ධම්මා ආපාතං ආගච්ඡන්ති. නො ච තජ්ජොව සමන්නාහාරො හොති. නෙවතාව තජ්ජස්ස විඤ්ඤාණභාගස්ස පාතුභාවො හොති.
ම.නි., මූලපණ්ණාසපාළි, ඔපම්ම වග්ග, මහාහත්ථිපදොපම සුත්ත
7. ද්විතීයඃ පරිණාමොයං - තෘතියඃ ෂඩ්විධස්‍ය යා
විෂයස්‍යොපලබ්ධියාඃසා - කුශලාකුශලා ද්වයා
ඤාණසීහ ස්ථවිර, හේන්පිටගෙදර, 1964, විඥප්තිමාත්‍රතා සිද්ධිවාදය, සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සමාගම, කොළඹ, පි. 159.
8. සර්වත්‍රගෛඃ විනියතෛඃ - කුශලෛශ් චෛතසෛස රසෞ
සම්ප්‍රයුක්තා තථා ක්ලේශෛඃ - රූප කලේශෛශ් ත්‍රිවේදනා
ඤාණසීහ හිමි, හේන්පිටගෙදර, 1964, විඥප්තිමාත්‍රතා සිද්ධිවාදය, සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සමාගම, කොළඹ, පි. 160.
9. ඉධ භික්ඛවෙ භික්ඛුනො යං නිමිත්තං ආගම්ම යං නිමිත්තං මනසිකරොතො උප්පජ්ජන්ති පාපකා අකුසලා විතක්කා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි
Chatta Sangayana CD Rom, Vipassana Research Institute Dhammagiri, Igatpuri,422 - 403 Disk, Nashik, India
10. පපඤ්චොති මත්ත පමත්තාකාරභාවෙන පවත්තානං තණ්හා දිට්ඨි මානානං එතං අධිවචනං
Chatta Sangayana CD Rom, Vipassana Research Institute Dhammagiri, Igatpuri,422 - 403 Disk, Nashik, India
11. ක්ලෙශෛශ් චතුර්භිඃ සහිතං - නිවෘතාව්‍යාකෘතෛඃ සදා
ආත්මදෘෂ්ට්‍යාත්මමොහාත්ම - මානාත්මස්නෙහසංඥිතෛඃ
ඤාණසීහ ස්ථවිර, හේන්පිටගෙදර, 1964, විඥප්තිමාත්‍රතාසිද්ධි, ත්‍රිංශිතිකා කාරිකා, 6 ශ්ලෝකය සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සමාගම, පි. 174.
12. ස්පර්ශාදෙය’’ රිති ස්පර්ශ මනස්කාර වෙදනා සංඥා චෙතනාභිඃ. එතෙ හි පඤ්චධර්මාඃ සර්වත්‍රගත්වාත් සර්වවිඥානෛඃ සම්ප්‍රයුජ්‍යතෙ. එතෛ රපි යත්‍ර ජාතස්, තන්මයෛ රෙව සම්ප්‍රයුජ්‍යතෙ. ඤාණසීහ ස්ථවිර, හේන්පිටගෙදර, 1964, විඥප්තිමාත්‍රතාසිද්ධිවාදය, ත්‍රිංශතිකා කාරිකා භෂ්‍යය, සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සමාගම, පි. 174.
13. තත්‍රාලයාඛ්‍යං විඥානං - විපාකං සර්වබීජකම් සාසනරතන හිමි, මොරටුවේ, විඥප්තිමාත්‍රතා සිද්ධිවාදය, ත්‍රිංශතිකා කාරිකා, 2 ශ්ලෝකය

14. තස්‍ය ව්‍යාවෘත්තිරහීතෙව, කිං පුන රහීත්‍වං යද්යොගාදහීන්නිත්‍යුච්‍යතෙ. ස්‍ය පුනර් යොගා දහීන්නිත්‍යුච්‍යතෙ? ක්‍ෂයඥානානුත්පාදඥාන ලාභාත්. තස්‍යාං හ්‍යවස්ථායාං ආලයවිඥානාශ්‍රිත දෞෂ්ඨුල්‍යනිරවශෙ ප්‍රහාණාදාලය විඥානං ව්‍යාවෘත්තං භවති. සෛව චාගී දවස්ථා.
15. විඥප්තිමාත්‍රතාසිද්ධිවාදය, ත්‍රිංශතිකා කාරිකා භාෂ්‍යය, 1964, සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සමාගම, පි. 170. විඥප්තිමාත්‍රමෙවෛත - දසදථාව භාසනාත් යථා තෛමිරිකස්‍යාසත් - කේශචන්‍ද්‍රාදී දර්ශනම් ඥාණසීහ ස්ථවිර, හේන්පිටගෙදර, විඥප්තිමාත්‍රතා සිද්ධිවාදය, 1964, 01 ශ්ලෝකය, සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සමාගම, පි. 145.
16. ආත්මධර්මෝපචාරෝහි - විවිධො යඃ ප්‍රවර්තතෙ විඥානපරිණාමෙ සෞ - පරිණාමඃ සච ත්‍රිධා ඥාණසීහ ස්ථවිර, හේන්පිටගෙදර, 1964, විඥප්තිමාත්‍රතා සිද්ධිවාදය - විශංතිකාව, ඇම්.ඩී. ගුණසේන සමාගම, කොළඹ, පි. 159.